**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද සහිත ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 04 වන මහල, සෙත්සිරිපාය I වන අදියර, බත්තරමුල්ල** ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) තනතුර සඳහා බඳවා ගැනීම"** ලෙස ලිවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 ජුලි මස 21 දින වේ.

   සටහන:- අයදුම්පත ලියාපදිංචි තැපෑල මඟින් එවීම අනිවාර්යය අතර, එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරු විසින් විඳදරා ගත යුතුය.

2. මෙහි දී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබේ.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

   3.1. සේවා ගණය - SL-1-2025 විධායක

   3.2. මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත වන අතර මාසිකව SL-1-2025 වැටුප් කේතය යටතේ 133,570.00ක දීමනාවක් හා අනුමත ජීවන වියදම් දීමනාව, ප්‍රවාහන දීමනා, දුරකථන දීමනා ගෙවනු ලැබේ.

   3.3. රාජ්‍ය සේවා පත්වීම් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීති අදාල වේ.

   3.4. තෝරාගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද යටත්විය යුතුය.

4. සුදුසුකම්

   4.1 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

   4.2 වෘත්තීය සුදුසුකම්:

   ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ ප්‍රවීණතාවයක් හා වසර 12 ක බැංකු කටයුතු පිළිබඳ අත්දැකීම් සහිත බැංකු ක්ෂේත්‍රයේ හෝ මූල්‍ය ආයතනයක සේවය කරන හෝ සේවය කර විශ්‍රාම ලැබූ විධායක ශ්‍රේණියේ නිලධාරියකු වීම

   සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

5. තනතුරට අදාල කාර්යයන්

5.1. සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතිය ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා වඩාත් කාර්යක්ෂම මට්ටමින් පවත්වා ගෙන යෑම

5.2. ක්ෂුද්‍ර මූල්‍ය අංශය සතු වත්කම් කළමනාකරණය කිරීම

5.3. ප්‍රජාව වෙත ණය ලබාදීම මෙන්ම ණය අයකර ගැනීම ද ක්‍රමවත්ව හා විධිමත් වන පරිදි කටයුතු කිරීම.

5.4. බැංකු සංගම්වල ක්‍රියාකාරිත්වය ශක්තිමත් ව පවත්වාගෙන යාම

5.5. ප්‍රජාව සවිබල ගැන්වීමේ කටයුතු සඳහා වැඩි දායකත්වයක් ලබාදීමට කටයුතු කිරීම

5.6. ප්‍රජා මූල බැංකු කටයුතු අධීක්ෂණය හා ප්‍රගතිය විමර්ශනය කිරීම

5.7. අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි

6. වයස් සීමාව - අවුරුදු 67ට නොවැඩි විය යුතුයි

7.7.1 බඳවා ගැනීමේ ක්‍රමය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතුව බැංකු ක්ෂේත්‍රයේ විධායක ශ්‍රේණියේ නිලධාරියකු හා දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියකුගෙන් යුතුව සමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් කරනු ලබන යෝග්‍යතා ඇගයීමකින් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) තනතුරට බඳවා ගනු ලැබේ.

7.2 ලකුණු ලබාදීමේ ක්‍රමය

| අනු අංකය | ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | පළපුරුද්ද | 40 |
| 02 | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 20 |
| 03 | ක්ෂේත්‍රයට අදාලව ඉදිරිපත් කර ඇති නව්‍ය සංකල්ප හා වැඩසටහන් | 20 |
| 04 | ඉංග්‍රීසි / දෙමළ / සිංහල ප්‍රවීනතාවය | 05 |
| 05 | පරිගණක දැනුම | 05 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | 10 |

සටහන:- උක්ත අංක 03 යටතේ තොරතුරු සනාථ කෙරෙන සහතික කළ ලේඛන හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඉදිරිපත් කළ යුතුය.

සී. ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.